34

# මුවදෙව්දාවත රචනා වීමට බලපෑ දේශපාලනික පසුබිම පිළිබඳ විවරණයක්

*විස්නා ලක්මාලි, එල්. ජී.*[1]

සිංහල පද්‍ය සාහිත්‍යයේ දැනට හමුවන පැරණිතම පද්‍ය ග්‍රන්ථය ලෙස හඳුනාගත හැකි ය. අනුචිත වර්ණනාවලින් යුතු කාව්‍ය ග්‍රන්ථයක් ලෙස බොහෝ දෙනාගේ විවේචනයට බඳුන් වුව ද, පාලන තන්ත්‍රය පිළිබඳ මෙහි යටින් දිවෙන අදහස අගය කළ යුත්තකි. මුවදෙව්දාවත මඟින් කතුවරයා මඛාදේව ජාතකයේ එන මඛාදේව රජුගේ බෝසත් ගුණ වර්ණනා කිරීමට පෙලඹී ඇත. නමුත් කතුවරයාගේ මුඛ්‍ය අරමුණ වූයේ මෙය ම දැයි සැකයක් පවතී. තත්කාලීන පාලක පන්තියේ බලලෝභී පාලනයට විරුද්ධ ව පහර එල්ල කිරීමට මෙම කෘතිය රචනා කරන්නට ඇත. මෙසේ සිය කෘතිය රචනා කිරීමේ දී ඔහුට බලපෑ දේශපාලන පසුබිම කවරේ ද යන්න පිළිබඳ විමර්ශනය කිරීම මෙහි මූලික අරමුණ වේ. මේ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය නම් ප්‍රාථමික මූලාශ්‍රය පාදක කොට ගැනීමයි. මුවදෙව්දාවත ලියැවුණු අවධියේ හා ඊට පෙර අවධිවල මෙරට පාලන තන්ත්‍රය අවුල් වියවුල් ස්වභාවයක් ගත් ආකාරය ඉතිහාසය පරීක්ෂාකර බැලීමේ දී පැහැදිලි වේ. පාලක පන්තියේ බල තණ්හාව ඊට ප්‍රධාන හේතුව විය. මෙහි ප්‍රතිඵලය වූයේ රජවරුන්ට, මැති-ඇමතිවරුන්ට, යුද භටයන්ට මෙන්ම සාමාන්‍ය ජනයාට ද මරණය අත් වීමයි. මේ සඳහා විසඳුම් වන්නේ පාලක පන්තිය සිය ආත්මාර්ථකාමීත්වය අතැර පරාර්ථකාමීත්වයෙන් යුතු ව කටයුතු කිරීමයි. මෙම යුගයේ පාලන කටයුතු ගෙනගිය පාලක පන්තියට පහර ගැසීම සිය මූලික අරමුණ කරගත් නිසා මහා කාව්‍යයක් සතු විය යුතු අංග බොහෝමයක් කතුවරයා අතින් ගිලිහෙන්නට ඇත. මේ අනුව පැහැදිලි වන්නේ මුවදෙව්දාවත තත්කාලීන යුගයේ දේශපාලනික සිදුවීම් මුල්කොට ගනිමින් රචනා වූ කාව්‍ය ග්‍රන්ථයක් බවයි.

ප්‍රමුඛ පදඃ දේශපාලනය, පාලක පන්තිය, පාලන තන්ත්‍රය, මඛාදේව, මුවදෙව්දාවත

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය*